Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව

ශ්‍රේණිය 12

විෂය නර්තනය

දෙවන වාරය **B -8**

නිපුණතාව 01 : නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් ප්‍රායෝගික කුසලතා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.7 : වෙනත් සම්ප්‍රදායවලට අයත් නර්තන අංග දෙකක් ඉදිරිපත් කරයි.

ක්‍රියාකාරකම 1.7 : ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය නර්තනය කරමු.

ඉගෙනුම් පල :

- අදාළ නර්තන අංගවල පසුබිම විස්තර කරයි.
- ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රය, නර්තන අංගවල තාල රූප නම් කරයි.
- ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රයට අදාළ බෙර පද, දවුල් පද තාල තබමින් කියයි .
- ශුද්ධ මාත්‍රය, මුල් මාත්‍රයට අදාළ කවි ගායනය කරයි.
- අදාළ පද, කස්තිරම්, කලාසම්, ඉරට්ටි, අඩවු නර්තනය කරයි.
- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදාය ත්‍රිත්වයෙහි මූලික අංගහාරවල හා චලනවල විවිධතා නිරීක්ෂණය කර අදහස් දක්වයි.
- සාම්ප්‍රදායික අංගහාර, ඉරියවු හා චලන ප්‍රදර්ශනය වන පරිදි අදාළ නර්තන අංග සාමූහික ව හා ඒකල ව ඉදිරිපත් කරයි.

ශිෂයා කල යුතු කාර්යයන් -

- පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ගේ මූලික අංගහාර පිළිබඳව මූලික දැනුමක් ලබා ගන්න.
- අන්තජාලය තුලින් හෝ වීඩියෝ දර්ශන මගින් ශුද්ධ මාත්‍රය හා මුල් මාත්‍රය නරඹා ඒ පිලිබදව අවබෝධයක් ලබා ගන්න.
- ඒ අනුව සාම්ප්‍රදායික ගති ලක්ෂණ ආරක්ෂා කර ගනිමින් නර්තනයේ යෙදෙන්න.

**ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත් පත් / වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක**

- 12ශ්‍රේණිය නර්තනය අතිරේක කියවීම් පොත - ජාතික අධ්‍යාපන ආයතනය
- Youtube https://youtu.be/zZrP8KMhlN4 / https://youtu.be/5nPZ6MnOn0I

ඇගයීම්

- උගත් නර්තනයට අදාළ පද හා කවි තාල තබමින් කියන්න.
- උගත් නර්තනාංගය ඒකල ව ඉදිරිපත් කරන්න.
- නර්තන සම්ප්‍රදාය ත්‍රිත්ත්වයෙහි මූලික අංගහාර ප්‍රදර්ශනය කරන්න.

**පහත සඳහන් ඇගයීම් ද සිදු කරන්න.**

- සති පාසල් කාර්‍ය පත්‍රිකා - 12 නර්තනය දෙවන වාරය A - 08

<u>පසු ක්‍රියාකාරකම්</u>

- ඉගෙන ගන්නා ප්‍රධාන නර්තන සම්ප්‍රදායට අමතර ඉගෙන ගන්නා මෙම නර්තන සම්ප්‍රදායන් දෙක පිලිබඳව තව දුරටත ප්‍රායෝගිකව නර්තනයේ යෙදෙන්න.
- මෙම නර්තන අංග දෙක තුලින් නවතම නර්තන අංගයක් නිර්මානය කරන්න.
- සාම්ප්‍රදායික හැඩ තල ආරක්ෂා කර ගැනීමට සම්ප්‍රදායන්ට ආවේනික හැඩ තල පිළිබඳව වැඩි දුරටත් අවදානය යොමු කරමින් නර්තනයේ යෙදෙන්න.

**සැකසුම - එච්. අයි. නීලකාන්ති. ර/ සුමනා බාලිකා විද්‍යාලය . රත්නපුර කලාපය .**